සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# නර්තනය

8 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ''තා තෙයියත් /// තා තෙයි'' මෙහි සරඹ නාමය වන්නේ,

(i) දෑල අඩිය (ii) පසු පෙර අඩිය (iii) නුහුරු අඩිය (iv) තුන් අඩිය

02 මහනුවර ඇසළ පෙරහැර පවත්වනු ලබන්නේ,

(i) වෙසක් මාසයේ ය. (ii) පොසොන් මාසයේ ය.

(iii) ඇසල මාසයේ ය. (iv) දුරුතු මාසයේ ය.

03 ''රත්නදීප ජන්මභූමි'' යන ගීතය ගායනා කරනු ලබන්නේ,

(i) විශාරද නන්දා මාලනී (ii) විශාරද පණ්ඩිත් අමරදේව

(iii) විශාරද සනත් නන්දසිරි (iv) විශාරද එඩ්වඩ් ජයකොඩි

04 මැණිකක් පිළිබඳ වර්ණනා කරන වන්නම වන්නේ,

(i) මයුරා වන්නම (ii) තුරඟා වන්නම (iii) වෛරොඩි වන්නම (iv) හනුමා වන්නම

05 වැදි යකුන් හා මෙලෙයි යකුන් පුද ලබන ශාන්ති කර්මය වන්නේ,

(i) දෙවොල් මඩු ශාන්ති කර්මය (ii) කොහොඹා කංකාරිය

(iii) පහන්මඩු ශාන්ති කර්මය (iv) බලි ශාන්ති කර්මය

- **06 - 11 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(ප්‍රකාශනාත්මක / දළදා / සූරිය දෙවි / තිත් තෙයි / තුරඟා / පාර්වතී දේවි / දෙවුන්දර දේවාල / වෛරෝඩි / තාලානුකූල)

06 2 + 3 දෙතිතට ........................................................................... වන්නම නටනු ලැබේ.

07 පතුරු හා සවරම් යන ගැමි නැටුම්වල ................................................................. පුද ලබයි.

08 තාලම්පටින් නිකුත් වන ධ්වනි දෙක වනුයේ ..................................................................

09 දීකිරි දීකිරි ගිතය .............................................................. චලන යොදාගනිමින් නර්තනය නිර්මාණය කරයි.

10 උඩරට නැටුම් පමණක් ................................................................. පෙරහැරේ දක්නට ලැබේ.

- **11 - 15 දක්වා ප්‍රහේලිකාව ඇසුරින් පිළිතුරු සපයන්න.**

<u>පහළට</u>

11 දකුණු ඉන්දියාවේ ප්‍රධාන නැටුම් සම්ප්‍රදායකි.

12 හින්දු ආගමික උත්සවයකි.

<u>හරහට</u>

13 භය නැමති ස්ථායි භාවයේ රසය වේ.

14 කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ ඌරා මර්ධනය කළේ මෙම දෙවි විසිනි.

15 නටරාජා හෙවත් ශිවගේ ආයුධයයි.

| | 13 | | 12 | | |
|---|---|---|---|---|---|
| 11 | භ | | න | | |
| | | | | | |
| | | | 14 | | |
| | | | 15 ත්‍රි | | |

- **16 - 20 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16 නම්‍යතා අභ්‍යාස මගින් ශාරීරික සුවතාව වර්ධනය කෙරේ. ( )

17 පහතරට බෙරය පොකුරු බෙරය නමින් හැඳින්වේ. ( )

18 පණීභාරත ගුරුතුමා උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි. ( )

19 දවුල පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන බෙරයයි. ( )

20 බලයට හා ශක්තියට අධිපති දෙවියා දුර්ගා නමින් හැඳින්වේ. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

01 ''දේශීය ගැමි නැටුම්වල දක්නට ලැබෙන සරළ බව හා අව්‍යාජ බව එහි අනන්‍යතාවය පිළිබිඹු කරයි.''

(i) ගැමි නැටුම්වල සුවිශේෂී ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ගැමි නැටුම් දැකිය හැකි අවස්ථා 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ ඉගෙන ගන්නා ශ්‍රේණියට අදාළ ගැමි කවියක් ලියන්න. (ලකුණු 04)

02 ''දේශීය සම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායන් සඳහා ඊට ආවේණික වාද්‍ය භාණ්ඩ පවතී.''

(i) දේශීය නර්තන සම්ප්‍රදායන් නම් කර ඒ හා බැඳි වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ලකුණු 03)

(ii) පහතරට බෙරය වාදනය කරන අවස්ථා 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) පහතරට බෙර ඇඳ එහි කොටස් නම් කරන්න. (ලකුණු 04)

03 ''ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ජාතික අනන්‍යතාව විදහා දක්වන මුදුන් මල්කඩ වූ කලී ශ්‍රී දළදා වහන්සේ ය.''

(i) දළදා පෙරහැර හා බැඳි චාරිත්‍ර විධි 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දළදා පෙරහැරට අයත් සතර දේවාල පෙරහැර නම් කරන්න. (ලකුණු 04)

(iii) දළදා පෙරහැර වර්ණවත් කරන දේශීය නර්තනාංග 4 ක් නම් කරන්න. (ලකුණු 04)

04 ''දේවදාසින්'' නැමති ස්ත්‍රීන් දෙවියන් පිනවීම සඳහා ඉදිරිපත් කළ ''දාසි ආට්ටම්'' භරත නාට්‍යම්වල ප්‍රභවය හේතු විය.''

(i) භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශ 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) තාන්ජාවූර් සහෝදරයින් 4 දෙනා නම් කරන්න. (ලකුණු 04)

(iii) එහි භාවිත සංගිත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ හඳුන්වන්න. (ලකුණු 04)

05 ''ප්‍රායෝගිකව භාවිත කරන නර්තන, ගායන, වාදන ලිඛිතව ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ප්‍රස්තාරකරණයයි.''

(i) මාත්‍රා 2 + 3 තාල රූපයට බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 02)

(ii) මාත්‍රා 3 + 3 තාල රූපයට අයත් වන්නමක කවියක් ලියන්න. (ලකුණු 03)

(iii) මාත්‍රා 2 + 3 තාල රූපයට අයත් ඩච්චක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 06 | තුරඟා | 11 | භරත | 16 | ✓ |
| 02 | iii | 07 | සූරිය දෙවි | 12 | නවරාත්‍රී | 17 | X |
| 03 | ii | 08 | තිත් තෙයි | 13 | භයානක | 18 | ✓ |
| 04 | iii | 09 | ප්‍රකාශනාත්මක | 14 | රාහු | 19 | X |
| 05 | ii | 10 | මහනුවර | 15 | ත්‍රිශූල | 20 | ✓ |

(1 x 20 = 20)

## II කොටස

01 (i) සාමූහිකව නර්තනය කිරීම, රංග උපකරණ භාවිතා කිරීම, සරළ බව හා එම කම පිළිබිඹු වීම, ගායනය යොදාගැනීම, ගැමි ඇඳුම් හා සාරධර්ම පිළිබිඹු වීම (කරුණු 3 කට ලකුණු 03)

(ii) විවිධ උත්සවවල, පෙරහැරවල, පාසලේ විවිධ ප්‍රසංගය (කරුණු 3 කට ලකුණු 03)

(iii) 8 ශ්‍රේණියට අදාළ ගැමි කවියක් විය යුතුයි. (පාද 4 ට ලකුණු 04)

02 (i) උඩරට - ගැටබෙරය / පහතරට - දෙවොල් බෙරය / සබරගමු - දවුල (ලකුණු 03)

(ii) දෙවොල්මඩු ශාන්ති කර්මයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ලෙස වාදනය කිරීම. මඟුල් බෙර වාදනය. වැදුම් අත්, දකුම් අත්, තාලම්, සවිඳම්, සුරල් වාදනය කිරීම (ලකුණු 03)

(iii) පහතරට බෙරය ඇඳ කොටස් 4 ක් වත් නම්කර ඇත්නම් (ලකුණු 04)

03 (i) නැකැත් සෑදීම, කප් සිටුවීම, දිය කැපීම (ලකුණු 02)

(ii) නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි (ලකුණු 04)

(iii) වෙස්, උඩැක්කි, පන්තේරු, රබන්, චේවැල්, සවරම්, ලී කෙළි, කුළු (ලකුණු 04)

04 (i) මදුරාසිය, තාන්ජෝරය (ලකුණු 02)

(ii) චින්නයියා, පොන්නයියා, වාඩිවේළු, ශිව නන්දන් (ලකුණු 04)

(iii) දක්ෂිණ භාරතයේ කර්ණාටක සංගීතය යොදාගැනීම, ප්‍රධාන වාද්‍ය භාණ්ඩය මෘදංගය වීම, වීණාව, බටනළාව, නට්ටුවාංගම් (තාලම්පට), වයලීනය, තාම්පූරාව ආදී වාද්‍ය භාණ්ඩ යොදාගැනීම සංගීතඥයෝ, මුත්තුකාරන් ලෙස හැඳින්වීම, තෙළිඟු, ද්‍රවිඩ, සංස්කෘත භාෂාවලින් රචිත ගීත යොදාගැනීම (ලකුණු 04)

05 (i)

| 1̂ | 2 | 1́ | 2 | 3 | 1̂ | 2 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| දො | - | ජිං | - | ත | ග | ත | දො | - | ත |

(ලකුණු 02)

(ii)

| 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | අග | ය | ව | ඩ | න | ක | වි | ව | රු | නා | - |
| ර | ග | ය | දූ | නෙයි | - | ක | ළ | ර | ච | නා | - |
| + | මට | උ | ර | නා | - | නො | ව | මෙ | දි | නා | - |
| ම | හ | තු | ගෙ | අ | ව | ස | ර | - | - | - | - |
| + | රැගෙ | න | ස | මා | - | වා | - | - | - | - | - |

(ලකුණු 03)

(iii)

| 1̂ | 2 | 1́ | 2 | 3 | 1̂ | 2 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| තක් | කඩ | තක් | කඩ | කුඳ | ත | ක | රොං | - | - |
| ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| ජි | ක | රොං | - | - | | | | | |

(ලකුණු 05)